# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2370/33 - 2024 පෙබරවාරි මස 10 වැනි සෙනසුරාදා - 2024.02.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: මහ/ඉ/අත්/379.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර :-

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 527 නාවින්න ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද මු.පි.කො. 10057හි ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0327ක් පමණ වූ පහත විස්තර කරන ඉඩම් :

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: සොයාගත නොහැක; ඉඩම් පරිහරණය: කපන ලද කාණුව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0086.

02. **කැබලි අංක 02**

ඉඩමේ නම: සොයාගත නොහැක; ඉඩම් පරිහරණය : සිමෙන්ති කාණුව; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0021.

03. කැබලි අංක 03

ඉඩමේ නම: ගොරක්ගහදෙණිය; ඉඩම් පරිහරණය : විවෘත මුඩුබිම; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් පාන්නා: සොයාගත නොහැක; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0220.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 මාර්තු මස 04 වැනි දින පෙ.ව. 09.00ට මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024.02.29 දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එම්. එම්. කේ. දිල්රුක්ෂි වල්පොල,
ප්‍රාදේශීය ලේකම්,
මහරගම.

2024 පෙබරවාරි මස 01 වැනි දින,
මහරගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0075


1A - G 041404 – 22 (2024/02)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

මගේ අංකය: ARA/LND/ACQVI/D3/64.
සංචාරක හා ඉඩම් අමාත්‍යාංශ අංකය: 4-3/18/2019/WS/439.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :-

සබරගමුව පළාතේ, කැගල්ල දිස්ත්‍රික්කයේ, අරණායක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ගල්බොඩ කෝරලේ අංක 44ඒ, හබලක්කාව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, හබලක්කාව ගමේ පිහිටි ජොෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් 2023.12.21 දිනැතිව පිළියෙළ කරන ලද කැඩැස්තර සිතියම් අංක 610388 දරන සිතියමේ කැබලි අංක 01 වශයෙන් පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0502 පමණ වූ ඉඩම සඳහා මායිම් :

01. **කැබලි අංක 01**

ඉඩමේ නම: කොබේකඩුවහේන; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0502.

මායිම් -

උතුරට: මන්නෙත්තියලාගේ සීලවතී සහ තවත් අය හිමිකම් කියන කොබේකඩුවහේන සහ මු. පි. කැ 3734 හි කැබලි අංක 9 සහ 11; නැගෙනහිරට : මු. පි. කැ. 3734හි කැබලි අංක 9 සහ 11; දකුණට: එම්. ඒ. සෝමාවතී මැනිකේ සහ තවත් අය හිමිකම් කියන අලුත් දූරයලාගේහේන සහ එම්. රණසිංහ සහ තවත් අය හිමිකම් කියන කොබේකඩුවහේන; බටහිරට: එම්. ඒ. සෝමාවතී මැණිකේ සහ තවත් අය හිමිකම් කියන අලුත් දූරයලාගේහේන සහ එම්. රණසිංහ සහ තවත් අය හිමිකම් කියන කොබේකඩුවහේන

වෙනත් කරුණු - ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානය යටතේ පවරා ගන්නා ලදී. මුල් හිමිකම්පාන්නා බී/18/1, මැදිලිය, හෙම්මාතගම පදිංචි මන්නෙත්තියලාගේ සමිලා දිසානායක, අත්කර ගැනීමේ කටයුතු අවසන් කිරීම සඳහා.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2024 මාර්තු මස 20 වැනි දින පෙ.ව. 10.00ට අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තව ද, 2024 මාර්තු මස 13 වන දිනට මත්තෙන් ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

ශාමලී පියතිස්ස,
ප්‍රාදේශීය ලේකම්,
අරණායක.

2024 පෙබරවාරි මස 07 වැනි දින,
අරණායක ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 02-0076

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.